මුඅද්දින් (සලාතය සඳහා අරයුම් කරන්නා)ගේ ඇරයුමට සවන් දෙන අවස්ථාවේ කවරෙකු: "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහූ, ලා ෂරීක ලහූ, වඅන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු, රළීතු බිල්ලාහි රබ්බන්, වබිමුහම්මදින් රසූලන්, වබිල් ඉස්ලාමි දීනන්" (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල්කරුවකු නොමැත. සැබැවින්ම මුහම්මද් ඔහුගේ ගැත්තාය. ඔහුගේ දූතයාය. යැයි සාක්ෂි දරමි. අල්ලාහ් පරමාධිපති බවත්, මුහම්මද් දූතයාණන් බවත්, ඉස්ලාමය දහම බවත්, පිළිගතිමි). යනුවෙන් පවසන්නේ ද ඔහුගේ පාපකම් සඳහා ඔහුට සමාව දෙනු ලබන්නේය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව සඃද් ඉබ්නු අබී වක්කාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "මුඅද්දින් (සලාතය සඳහා අරයුම් කරන්නා)ගේ ඇරයුමට සවන් දෙන අවස්ථාවේ කවරෙකු: "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහූ, ලා ෂරීක ලහූ, වඅන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු, රළීතු බිල්ලාහි රබ්බන්, වබිමුහම්මදින් රසූලන්, වබිල් ඉස්ලාමි දීනන්" (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත. ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල්කරුවකු නොමැත. සැබැවින්ම මුහම්මද් ඔහුගේ ගැත්තාය. ඔහුගේ දූතයාය. යැයි සාක්ෂි දරමි. අල්ලාහ් පරමාධිපති බවත්, මුහම්මද් දූතයාණන් බවත්, ඉස්ලාමය දහම බවත්, පිළිගතිමි). යනුවෙන් පවසන්නේ ද ඔහුගේ පාපකම්
සඳහා ඔහුට සමාව දෙනු ලබන්නේය." [صحيح] [رواه مسلم]

මුඅද්දින් (සලාතය සඳහා කැඳවන්නා)ගේ ඇරයුමට සවන් දෙන අවස්ථාවේ පහත සඳහන් ප්රාර්ථනාව කරන්නා පිළිබඳ ව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියහ. "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහූ, ලා ෂරීක ලහූ" එනම්: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් ඔහු හැර නැමදුම් ලබන සෙසු සියල්ල ව්යාජ බවත් මා පිළිගෙන එය දන්වා සිටිමි යන්නයි. "වඅන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු" එනම්: සැබැවින්ම මුහම්මද් තුමාණන් නැමදුම් නොලබන ගැත්තකු බව හා බොරු නොකියන දූතයකු බවය. "රළීතු බිල්ලාහි රබ්බන්," (අල්ලාහ් පරමාධිපති බව පිළිගතිමි) එනම් ඔහුගේ පරිපාලනය, ඔහුගේ දේවත්වය හා ඔහුගේ නාම හා ගුණාංග සම්බන්ධයෙනි. "වබිමුහම්මදින් රසූලන්" (මුහම්මද් දූතයාණන් බව ද පිළිගතිමි) එනම් එතුමාණන් කවර දූත පණිවිඩයක් ගෙන ආවේ ද කවර කරුණක් අප වෙත දන්වා සිටියේ ද ඒ සියල්ල සම්බන්ධයෙනි. "වබිල් ඉස්ලාමි" (ඉස්ලාමය පිළිබඳව) එනම් ඉස්ලාමයේ පවතින නියෝග හා තහනම් සියුලුම නීතී සම්බන්ධයෙනි. "දීනන්" ප්රතිපත්තිමය වශයෙන් හා අවනත වීමක් වශයෙන් ඔහුගේ පාපකම් සඳහා ඔහුට සමාව දෙනු ලැබේ. එනම් සුළු පාපකම් සඳහාය.